# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2084/64 – 2018 අගෝස්තු 17 වැනි සිකුරාදා – 2018.08.17**

**(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/COM/02/2017/212.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. එච්. සුනීත මයා, දියවර ගම්මානය, පල්ලෙරොට - මාමඩල, අම්බලන්තොට.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මධ්‍යම සංස්කෘතික අරමුදල, අංක 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවින්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.


1A – G 28319 – 17 (2018/08)

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මගේ අංකය: IR/COM/02/2017/212.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. එච්. සුනීත මයා, දියවර ගම්මානය, පල්ලෙරොට - මාමඩල, අම්බලන්තොට.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

මධ්‍යම සංස්කෘතික අරමුදල, අංක 212/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආදේශක රියදුරෙකු ලෙස සේවය කරන කේ. එච්. සුනීත මහතාව, රියදුරු තනතුරේ ස්ථිර නොකිරීම යුක්ති සහගත ද? එසේ නොවන්නේ නම් එම සේවකයාට හිමිවිය යුතු සහන මොනවාද? යන්න පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී
දින යොදන ලදී.

08 – 1184

---

මගේ අංකය: IR/COM/05/2017/215.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම (එන්. ඒ. සහබන්දු මයා වෙනුවෙන්).

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඇක්මි ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජිං පීඑල්සී, අංක 318, ගෝනමඩිත්ත පාර, පිලියන්දල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03 හි ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: අයිආර්/සීඕඑම්/05/2017/215.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම (එන්. ඒ. සහබන්දු මයා වෙනුවෙන්).

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඇක්මි ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජිං පීඑල්සී, අංක 318, ගෝනමඩිත්ත පාර, පිලියන්දල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ඇක්මි ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් පීඑල්සී හි නිෂ්පාදන වැඩමුලික (Production Foreman) ලෙස සේවය කළ එන්. ඒ. සහබන්දු මහතාට වයස අවුරුදු 60 වන තෙක් එම ආයතනයේ සේවය කිරීමට අවස්ථාව ලබා නොදී වයස අවුරුදු 55 සම්පූර්ණ වූ 2017.11.27 දිනෙන් විශ්‍රාම ගැන්වීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

08 – 1185

---

*මගේ අංකය* : IR/COM/01/2017/251.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. ඒ. මුහන්දිරම්ගේ මයා, අංක 22/1, පළමු පටුමග, ගම්මාන පාර, මහරගම.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලුමියර් ටෙක්ස්ටයිල්ස් (පුද්ගලික) සමාගම, ලොට් 15, බ්ලොක් "A", වල්ගම, මල්වාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, හෙද පුහුණු විදුහල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: IR/COM/01/2017/251.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. ඒ. මුහන්දිරම්ගේ මයා, අංක 22/1, පළමු පටුමග, ගම්මාන පාර, මහරගම.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලුමියර් ටෙක්ස්ටයිල්ස් (පුද්ගලික) සමාගම, ලොට් 15, බ්ලොක් "A", වල්ගම, මල්වාන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ලුමියර් ටෙක්ස්ටයිල්ස් (පුද්ගලික) සමාගමේ සාමාන්‍යාධිකාරි/මානව සම්පත් ලෙස 2011.10.01 සිට 2014.07.23 වැනි දින දක්වා සේවය කළ පී. ඒ. මුහන්දිරම්ගේ මහතා වෙත වාහන දීමනා, රියදුරු දීමනා සහ ඉන්ධන දීමනා ලෙස ගෙවිය යුතු මුදල ආයතනය මගින් නොගෙවීම යුක්ති සහගත ද? එසේ නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ."

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ කාර්යාලයේ දී
දින යොදන ලදී.

08 – 1086

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.